# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2276/26 – 2022 අප්‍රේල් මස 21 වැනි බ්‍රහස්පතින්දා – 2022.04.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(x)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේවන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 17745 දරන සමාගමක් වන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඈ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2022 පෙබරවාරි මස 25 වන දින අංක 2268/90 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව" යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II තීරයන් යටතේ නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය සහ සෞඛ්‍ය නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (එස්එල්කිව්එෆ් 6 වන මට්ටම) සම්බන්ධයෙන් වන උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යා හෝ තාක්ෂණවේදය යන විෂය ධාරාවලින් මුහුණ දී එකවර සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) ලබා තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

1A – PG 5820– 510 (2022/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

**II වන උපලේඛනය**

| I වන තීරය<br>*උපාධිය* | II වන තීරය<br>*උපාධිය සඳහාවන කෙටි යෙදුම* |
|---|---|
| වෛද්‍ය සහ සෞඛ්‍ය නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ගෞරව (වෛද්‍ය සහ සෞඛ්‍ය නිෂ්පාදන කළමනාකරණය) |

**දිනේෂ් ගුණවර්ධන,**
අධ්‍යාපන අමාත්‍ය,

2022 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 04-0095